ගොවි කටයුතු අධ්‍යයනය 1 (1984), 15-22

# ජල පාලනය හා ජල පාලනය සඳහා ගොවි සහභාගිත්වය

අයි. රණසිංහ පෙරේරා
විසිනි.

ජල පාලනය අද බෙහෙවින් සාකච්ඡාවට භාජනය වී ඇත්තා වූත්, ආර්ථික වශයෙන් මෙන්ම සමාජීය වශයෙන්ද වැදගත් වූත්, ප්‍රශ්නයකි. එසේ වුවද ජල පාලනය, ක්ෂණිකව, සරලව විසඳිය නොහැකි, සංකීර්ණ කරුණු රාශියක් හා බැඳී පවතින, තාක්ෂණික, සාමාජීක, ආකල්ප හා ඇතැම් විට දේශපාලන කරුණු මත ද තීරණය වන්නක් බව නොරහසකි. මෙ නිසා ''ජල පාලනය'' සමස්ථයක් වශයෙන් ගෙන සාකච්ඡා කිරීමට පෙර ජලපාලනය යනු කුමක්දැයි නිර්වචනය කිරීම වැදගත් වනු ඇත.

කෘෂිකර්මය සඳහා ජල භාවිතය පිළිබඳ උපරිම කාර්යක්ෂමතාවයක් ඇති කිරීම ජල පාලනය යයි කිව හැක. මෙය එතරම් පැහැදිලි නිර්වචනයක් නොවේ. යම් යම් පැලෑටි වර්ගයන්ට යම් යම් ප්‍රදේශ හා දේශගුණික රටාවලදී, ඒ ඒ පස් වර්ගයේ ස්වභාවය මත විවිධ ප්‍රමාණයෙන්, ජලය අවශ්‍ය වේ. මේ නිසා ජල පාලනය යනු ''අවශ්‍ය වේලාවට, අවශ්‍ය තැනට, අවශ්‍ය ප්‍රමාණයෙන් ජලය සැපයීම'' යයි නිර්වචනය කිරීම වඩාත් යෝග්‍ය යයි සිතිය හැකිය.

## 1. ජල පාලනය අවශ්‍ය ඇයි?

i. ජලය සම්පතකි. පාරිභෝගික කෘෂිකර්මයේ ප්‍රධානතම යෙදවුමක් බවට පත්ව ඇත්තේ ජලයයි. මෙ නිසා ජලය ආර්ථික වටිනාකමකින් යුතුවේ. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ආර්ථික යෙදවුමක් වශයෙන් යොදන්නේ නම් ඒ සඳහා මිලක් තීරණය වනු ඇත. මිලක් තීරණය වූ භාණ්ඩයක් නිදහසේ පාලනයකින් තොරව යෙදවීම අනාර්ථික ය. මෙ නිසා ආර්ථිකමය වටිනාකමක් ඇති භාණ්ඩයක් ආර්ථිකමය පසුබිමක් මත යෙදවීමට නම් කිසියම් පාලනයක් අවශ්‍ය වේ. වාරිමාර්ග ඉදිකිරීම් සඳහා භෞතිකමය පිරිවැය, ඉංජිනේරු කාර්මික හා වෙනත් කටයුතු සඳහා ශිල්පීය ශ්‍රම පිරිවැය හා නඩත්තු පිරිවැයත් සලකා බලන විට එක් වතුර අක්කර අඩියක ආර්ථික වටිනාකම දළ වශයෙන් රුපියල් 1000 ක් වන බවට ගණන් බලා තිබේ.

අක්කරයක් සඳහා එක් ගොවියෙකුගේ අවම ජල අවශ්‍යතාවය වාරි කෘෂිකාර්මික ප්‍රදේශයක දී සාමාන්‍ය වශයෙන් අක්කර අඩි 5 - 6 පමණ වේ. මුල් යුගයේ ඉඩම් හිමි ජනපද ගොවියෙකුගේ කුඹුරු ප්‍රමාණය අවම වශයෙන් අක්කර 3-4 පමණ වනු ඇත. මේ දත්තයන් අනුව එක් ගොවියෙකුගේ වර්ෂයක ජල පාරිභෝජන වියදම (රු. 1000X5. 5X3. 5X2) වනු ඇත එය රු. 38500/-කි. මෙය එක් ගොවි මහතෙකු වෙනුවෙන් දැරිය යුතු අවම ජල පාරිභෝජන වියදමයි. එහෙත් ඇත්ත වශයෙන් මේ වියදම මීට වඩා වැඩිවන බවක්

ඇතැම් වාරිමාර්ග යෝජනාක්‍රම වලදී කරන ලද සමීක්ෂණ වලදී පෙනී ගොස් ඇත. අවම වශයෙන් පාවිච්චි කළයුතු ජල ප්‍රමාණයට වඩා වැඩි අක්කර අඩි ප්‍රමාණයක් බොහෝ යෝජනා ක්‍රමඋලදී පාවිච්චි වීම නොවැළැක්විය හැකි කරුණකි. තාක්ෂණික අඩුපාඩු නිසා මෙන්ම ගොවීන්ගේ ඇතැම් නාස්තිකාරී පාරිභෝජන රටා නිසා ද, නිලධාරි අක්‍රමිකතා නිසා ද මේ තත්වය උදවිය හැකිය. උඩවලවේ යෝජනා ක්‍රමයේ ඇතැම් ප්‍රදේශ වල අක්කරයට අක්කර අඩි 20 පාවිච්චි කළ අවස්ථා වාර්තා වී තිබේ.

ii. මුලින් පැහැදිලි කළ අයුරින ජල පාලනය ඉමහත් ආර්ථික සංවර්ධන අවශ්‍යතාවයක් බව පැහැදිලි කරුණකි. එහෙත් ජලය පාලනය සඳහා කෙත් ඇලක් පාසා නිලධාරීන් යෙදවීම රජයට නොහැකි නිසා පහත සඳහන් විකල්පයන් ඉදිරිපත් වනු ඇත.

- o වෙනත් ආර්ථික භාණ්ඩයක් මෙන් ජලය සඳහා මිළ පැවරීමෙන් කරනු ලබන ජල පාලනය.
- o ජලය සම්පතක් බවත්, තීරණාත්මක ආර්ථික සාධකයක් ලෙසත් පැහැදිලි කිරීමෙන් හා පැහැදිලි වීමෙන් සිදුවන ස්වයං ජල පාලනය.

මින් පළමුවැන්න ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක කිරීමට අපහසු විසඳුමක් බව ගොවි ආර්ථික හා සමාජ තත්වය දන්නා හඳුනන කවරුත් අනුමත කරනු ඇත. ගොවියෙකුගේ වාර්ෂික ජල පරිභෝජන වියදම කිසි දිනෙක ආර්ථික වටිනා-කමක් වශයෙන් ගොවීන් වෙත පැවරිය නොහැකිවා මෙන්ම එය ගොවීන් නොවන අය සමඟ සසඳන කළ සමාජ ආර්ථික විෂමතාවය තහවුරු කෙරෙන සාධකයක් ද වනු ඇත.

මේ අනුව විකල්ප විසඳුම් අතර ඉතිරිව ඇත්තේ ස්වයං පාලනයයි. මේ නිසා ජල පාලනය සඳහා නිලධාරීන් හා ගොවීන් උනන්දු කරවීම, ජල පාලනයේ නව තාක්ෂණික හා සමාජ ශිල්පක්‍රම සොයා බැලීම හා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම ඉස්මතුව පවතී.

iii. එදට වඩා අද ජනගහණය වර්ධනය වී ඇත. වගා කරන කුඹුරු ප්‍රමාණය වැඩිවී ඇත. වැව් රක්ෂිත, ඇල රක්ෂිත, පාර රක්ෂිත සියල්ල වගා බිම් බවට පරිවර්තනය වී ඇත. සීඝ්‍ර සංවර්ධනයේ අවශ්‍යතාවයක් වශයෙන් වැඩි භූමියක් වගා කොට ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට නොදියුණු ආර්ථිකය බල කරනු පෙනේ.

iv. ජලය ඇත්ත වශයෙන්ම කෘෂි නිෂ්පාදිතයේ ඍජු යෙදවුම් විචල්‍යයකි. ඇතැම් වාරිමාර්ග කෙත් ඇල වල දී කරන ලද පරීක්ෂා වලදී පැහැදිලි වී ඇති කරුණක් නම් හැම විටම කෙත් ඇල ඉහළ ගොවීන් යහපත් අස්වැන්නක් ලැබීමත්, ඇල අගාවත ගොවීන් බොහෝ විට අයහපත් අස්වැන්නක් ලැබීමත් ය. මේ නිසා ඇල අගාවත ගොවීන් ගෙන් ආර්ථිකය ඉදිරියට ගෙන ඒමේ හා ඔවුන්ගේ සාමාජික පසුබිම යහපත් කරලීමේ ප්‍රධාන වගකීම ජල පාලනය සතු කර ගෙන ඇත. අනෙක් අතින් ජලය බෙදා ගැනීමේ ගැටළු මත ඇති වී තිබෙන බොහෝ සාමාජික ප්‍රශ්නයන් ද යහපත් ජලපාලන ක්‍රමයක් සමඟ අතුරුදහන් වනු ඇත.

**2. ජලපාලනය තීරණය වන හා ජලපාලනය ක්‍රියාත්මක කළ හැකි ක්‍රම කීපයකි.**

i. වාරි ශිල්පීය උපක්‍රම මගින් ජල පාලනය.

ජල පාලනයේ ප්‍රධානතම උපක්‍රමයක් වනුයේ වාරි ශිල්පීය උපක්‍රමයන් ය. වැව් අමුණු, ඒවායේ පිහිටීම, ඉදිකිරීම හා වෙනත් භෞතික උපකරණ, බැවුම්, දොරවල්, ඇතුළුමුව ( INLET) සහ වෙලි ආදී ලොකු කුඩා සෑම වාරි උපක්‍රමයක්ම අවශ්‍ය තැනට අවශ්‍ය වේලාවට අවශ්‍ය ප්‍රමාණයෙන් ජලය ලබාදීම තීරණය කිරීම සඳහා සැලසුම් කරන ලද ඒවාය.

ii. ගොවිපල තුළ ජල පාලනය

මෙහිදී අවශ්‍ය වේලාවට අවශ්‍ය ප්‍රමාණයෙන් ජලය ලබාදීම සඳහා ගොවිපල තුළ කෙරෙන ජල කළමණාකරණය වැදගත් වේ. ඒ ඒ පැලෑටියට අවශ්‍ය ජල අවශ්‍යතාවයට වැඩි වැදගත්කමක් ලැබෙනු ඇත. පසේ ස්වභාවය, පැලෑටියේ ස්වභාවය හා බිම් සකස් කිරීම ආදී කරුණු සහ විවිධ කෘෂි ශිල්පීය කරුණු මත ගොවිපල තුළ ජල පාලනය තීරණය වනු ඇත.

iii. ගොවි ජල පාලනය

කිසියම ගොවි සමූහයක් වෙත ලැබෙන ජලය බෙද ගැනීම හා කළමණාකරණය කර ගැනීමත්, නාස්තිය ද ලක්වා ගැනීමෙන් ජල භාවිතය පිළිබඳ කාර්යක්ෂමතාවයක් ඇති කිරීමත් මෙහිදී අදහස් කෙරේ. මෙය මුළුමනින්ම ගොවීන්ගේ හැසිරීම් රටාව මත තීරණය වන නමුදු හැසිරීම් රටාව තීරණය වන පරිසරික සාධක අමතක කළ යුතු නොවන අතර, ගොවි ආකල්ප, පුරුදු පුහුණු, බෙදහද ගැනීම, අරපිරිමැස්ම, සහයෝගය, සංවිධානය වැනි කරුණු ගොවි ජල පාලනයේ තීරණාත්මක සාධක වනු ඇත.

3. ගොවි ජල පාලනය ක්‍රියාත්මක කළ හැකි ක්‍රම

i. ගොවි සමූහය වෙත ලැබෙන ජලය බෙදදීමේ නිලධාරි ක්‍රමය

මෙහි සාර්ථකත්වය තීරණය වනුයේ රජය විසින් යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව, නිලධාරි මහතුන්ගේ ක්‍රියාකාරී බව හෝ උදාසීන බව, ගොවි-නිලධාරි සම්බන්ධීකරණය, ගොවි ආකල්ප හා නිලධාරි ආකල්ප අනුව අන්‍යෝන්‍ය වශයෙන් ලැබෙන සහයෝගය යන කරුණු මත ය. මෙතෙක් ලබා ඇති අත්දැකීම් අනුව ගොවි ජල පාලනයේ නිලධාරී ක්‍රමය එතරම් සතුටුදායක යයි කීම අපහසු ය.

ii. ගොවි නියෝජිතයින් මගින් ජල පාලනය

සාමාන්‍යයෙන් වෙල් විදානේ, වගා නිලධාරි සහායක හෝ යාය පාලක යන නම් වලින් හඳුන්වනු ලබන ගොවීන්ගේ ඡන්දයෙන් පත්වනු ලබන නියෝජිතයෙකු විසින් මේ ක්‍රමය පවත්වාගෙන යනු ලබයි. ගොවි නියෝජිත මහතාට ලැබුනු ඡන්ද සංඛ්‍යාව, ඔහුගේ සේවය වෙනුවෙන් ගොවීන් ඔහුට ගෙවනු ලබන සලාරිස් හෝ සුහන්දිරම් හා ගොවීන් හා ඔහු අතර ඇති සුහදතාවය යන කරුණු මෙම ක්‍රමයේ සාර්ථකත්වයේ මිනුම් දඬුවේ. ඇතැම් විට කාසියේ වාසියට වෙල්විදානේ ලෙස පත්වූවන් ද ඇති නිසා ගොවි නියෝජිතයෙකුට සහයෝගය නොදෙන්නන්ගේ සංඛ්‍යාව සහයෝගය දෙන්නන්ගේ සංඛ්‍යාවට සමාන විය හැකිය. එහෙත් ජල පාලනයේ ගොවි සහභාගිත්වය පිළිබඳව සලකා බලන විට මෙම ක්‍රමය ජල පාලක නිලධාරි මඟින් ගොවි ජල පාලනය කිරීමට වඩා ඉදිරියෙන් සිටී.

### iii. ගොවි සංවිධාන හෝ සමාජ කණ්ඩායම් මගින් කරනු ලබන ජල පාලනය

ගොවි ජල පාලනයේ විවිධ ක්‍රම අතර මෙම ක්‍රමය මුළුමනින්ම ගොවි සහභාගිත්වය ලබා ගැනීමට ඉඩකඩ ඇති ශිල්පී ක්‍රමයක් වේ. ඓතිහාසික වශයෙන් සොයා බැලූවිට ජල පාලනයේ සැලකිය යුතු මාධ්‍යයක් බවට සමාජ සමූහ තීරණ හේතුවී ඇති බව පෙනී යන්නකි. සමාජ කණ්ඩායම් හෝ ගොවි සංවිධාන මගින් ජල පාලනය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම, මුලින් පැහැදිලි කළ වාරි හා කෘෂි ශිල්පීය ජල පාලනය තරම් ම වැදගත් කරුණක් බව අද පැහැදිලි වී ඇති කරුණකි. මේ පිළිබඳව සොයාබැලීම සංකල්ප හා අරමුණු පැහැදිලි කිරීම සහ අනුගමනීය වැඩ පිළිවෙලවල් දියත් කිරීම අද විෂයයක් බවට පත්විය යුතුව තිබේ. ගොවි සහභාගිත්වය මගින් ජල පාලනය සඳහා පූර්ව අවශ්‍යතාවයන් වශයෙන් ඉහත දක්වූ විවිධ ප්‍රධාන හා අප්‍රධාන ජල පාලන උපක්‍රම එකිනෙකට බැඳී අන්‍යොන්‍ය වශයෙන් බලපානු ලබන බව සැළකිල්ලට ගැනීම වැදගත් ය.

## 3. ජල පාලනය සඳහා ගොවි සහභාගිත්වයේ වැදගත්කම

i. ජලපාලනය සඳහා ගොවි සහභාගිත්වය අවශ්‍ය වනුයේ ඇත්ත වශයෙන්ම ගොවි සහභාගිත්වයෙන් තොරව ක්‍රමවත් ජල පාලනයක් ක්‍රියාත්මක කළ නොහැකි බැවිනි. ගොවියා ජල පාලනයේ තීරණාත්මක සාධකයක් වන නිසා ඔහුට සියළු ජල පාලන සාධකයන්ගේ ප්‍රතිඵල වෙනස් කළ හැකිය. සියළු ඉදිකිරීම් හා උපකරණ හොඳින් පැවතිය ද ඔහු එම ජල පාලනයට සහයෝගය නොදෙයි නම් ඉතා ඉක්මණින් ඇලවේලි දොරවල්, ඇතුළුමුව මෙන්ම වෙනත් උපකරණ ද ඔහුගේ අවශ්‍යතාවය පරිදි කැඩී බිඳී යනු ඇත. එය බොහෝ වාරිමාර්ග ක්‍රම වලදී පැහැදිලිව දක්නට ඇති කරුණකි. කොතෙක් නිලධාරී සිටිය ද ගොවීන් ඔවුන්ගේ වැඩපිළිවෙලට සහයෝගය ලබා නොදේ නම් එම නිලධාරි ක්‍රියාකාරීත්වයෙන් ද ප්‍රයෝජනයක් ගත නොහැකිය. මේ නිසා සියළු ජල පාලනයන්ගේ අවසාන ප්‍රතිඵලය ගොවියා මගින් කෙරෙන ජල පාරිභෝජනයෙන් කෙළවර වන නිසා ගොවියාගේ ජල පරිහරණ පුරුදු, ඔහුගේ අදහස් උදහස් හා ඔහු ජලය ලබාගැනීමට අනුගමනය කරන ක්‍රම මත ජල පාලනයේ අවසන් ප්‍රතිඵල තීරණයවේ. මේ නිසා ජල පාලනයේ සියළු තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතා කළ ද, ගොවිආකල්ප හා සමාජීය හැසිරීම් අනුව සකස් වූ කිසියම් සාමූහික හෝ සංවිධානශීලී පාරිභෝජන රටාවක් ඇති කරන තුරු ජල පාලනයේ ක්‍රමවත් බවක් ඇති කළ නොහැකිය.

ii. උපරිම ජල කාර්යක්ෂමතාවයක් ඇති කිරීම

ගොවි ජල පාලනයේ කාර්යක්ෂමතාවයක් ඇති කිරීමේ තීරණාත්මක උපදේශකයා ගොවියායි. තමා වගා කරන භූමි ප්‍රදේශයේ බෑවුම්, කඳු, වැලි සහිත තැන්, මඩ සහිත තැන්, නිතර සෙදී යන තැන්, වැසි කළට කැඩී බිඳී යන තැන්, ජලය බැස්සවීමේ පහසු තැන්, ජලය ලබා ගැනීමේ පහසු තැන්, ඊළඟ ජල මුරය ලැබෙන තුරු ජලය කළමණාකරණය කළ යුතු ආකාරය ආදී සියළු දේ පිළිබඳව කාලයක් එකම භූමියේ වගා කළ ගොවියා තරම් කිසිදු ශිල්පියෙකු නොදන්නා බව කිවයුතු නොවේ. මේ නිසා ජලයේ කාර්යක්‍ෂමතාවයට හේතුවන ඉහත කී කරුණු ගොවි සහභාගිත්වය ලබා නොගන්නා තත්වයකදී ජල පාලනය සඳහා යොදවා ගැනීමට අවස්ථාවක් නොලැබෙනු ඇත.

iii. ඉදිරියේ දී නව කෘෂිකාර්මික බිම් බවට පරිවර්තනය වන භූමිය වගා කිරීම සඳහා ස්ථාවර සැපයුමක් සේ ජලය සැලකූ විට ජල පාලනය යෙදවුම විචල්‍ය වේ මේ නිසා කෙත් ඇලක මෙම පාලනය නිලධාරි ක්‍රමයක් මගින් කරනානේ නම් ඒ සඳහා වැය වන සියළු ආර්ථික පිරිවැය ගොවි සහභාගිත්වයෙන් කෙරෙන ජල පාලනය නිසා මැකී යනු ඇත. සීඝ්‍ර සංවර්ධනයක් අපේක්ෂා කරන රටක් වශයෙන් එය විකල්ප ආයෝජන මාර්ග සඳහා යෙදවිය හැකිව තිබෙන සම්පත් වැඩි කරලීමේ මාධ්‍යයක් වනු ඇත.

ඓතිහාසික කරුණු පිරික්සීමේ දී තාක්ෂණික වශයෙන් මෙන්ම සමාජීය වශයෙන් ද ජල පාලනය පුරුදු කළ බවට සාක්ෂි ඇත. ''අහසින් වැටෙන ජල බිඳකුදු ප්‍රයෝජනයට නොගෙන මුහුදට යා නොදී'' යනුවෙන් පොළොන්නරු යුග ඉතිහාසයේ සඳහන් වන්නේ වැසි දියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා කෙරුණු වැව් අමුණු බැඳීමෙන් කළ තාක්ෂණික ජල පාලනයයි. කොණ්ඩවටවාන සෙල් ලිපියේ ''නාස්තිකාරී ජල පාරිභෝජන දඬුවම්'' ජලය පිළිබඳව කායවීක්ෂම හා සාමූහික ප්‍රතිලාභ තහවුරු කිරීමට ගත් උත්සාහයකට කදිම නිදසුනකි. ''උදකපති'' ''දකපති'' බදු ඇතිකිරීම ජල පාලන ක්‍රම සඳහා ගත් දේශපාලන උත්සාහයන් විය හැක.

ජල පාලනය සඳහා ගොවීන්ගේ සහභාගිත්වය අවශ්‍ය බව අද බොහෝ උගතුන් පිළිගනු ලැබුව ද, යම් යම් මිථ්‍යා ආකල්පයන් ද ඇතැමුන් අතර ඇති බව සඳහන් කළ යුතුය. මෙහිදී ප්‍රධාන වශයෙන් ඉස්මතු වන්නක් නම් ගොවීන් කෙරේ සියළුම වරද පවරා ඔවුහු කඩාකප්පල්කාරී නාස්තිකාරී පිරිසක් ලෙස සැලකීමේ මුල් බැසගත් ආකල්ප සහිතව ක්‍රියා කිරීමයි. අනෙක් කරුණ නම් ''ගොවීනට කිසිවක් කළ නොහැකිය'' යන අදහස පිළිගත් අය විසින් ඇතැම් විට ජල පාලන සැලසුම් ක්‍රියාත්මක කරවීමයි. යහපත් ජල පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ දී මෙම අදහස් දෙකම එකසේ අහිතකර ප්‍රතිඵල ගෙන දෙන අතර යම් යම් තාක්ෂණික ක්‍රම මෙන්ම ජල පාලනය සඳහා ගොවි සහභාගිත්වය සඳහා ද අනිවාර්යයෙන් විශ්වාස තැබීමට සිදු වේ.

## 4. ගොවි සහභාගිත්වය ලබා ගැනීමේ ශිල්ප ක්‍රම.

''ජල පාලනය සඳහා ගොවි සහභාගිත්වය'' අද විෂයක්ව තිබේ. මෙහිදී ප්‍රධාන වශයෙන් ගොවීන්ගේ සමාජ රාමු දෙකක් යටතේ ගොවි සහභාගිත්වය ලබා ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීමට සිදුවේ.

- o සුළු වාරිමාර්ග ආශ්‍රිත කුඩා ග්‍රාමීය ගොවීන්.
- o මහා වාරිමාර්ග ආශ්‍රිත ජනපදික ගොවීන්.

සුළු වාරිමාර්ග ආශ්‍රිත කුඩා ග්‍රාමීය ගොවීන්ගේ සමාජ රටාව තීරණ වී ඇති සාධක එතරම් ගැටළු සහගත බවක් පෙනෙන්නට නැත. සම්ප්‍රදායික ග්‍රාමීය රටාව, නෑදෑයින් හිතවතුන්, ඔවුනොවුන් අතර සිදුවන නිරන්තර සංනිවේදනය, සහයෝගය, වප-සරියේ කුඩා බව ආදී සාධක තුල කුඩා වාරිමාර්ග ගොවිජන රටාව ඔවුන්ගේ පොදු සහයෝගිත්වය ලබා ගැනීමට තරමක් හිතකර බව පෙනේ.

මහා වාරිමාර්ග වලදී ඉහත කී පසුබිම් මුලුමනින්ම වෙනස්ව ඇති බැවින් ඔවුන්ගේ සමාජ රාමුව තරමක් ඒකරාශි කිරීමට බාධාකාරී ස්වභාවයකින් යුතු බවක් පෙන්වයි. විවිධ දිස්ත්‍රික් වලින් පැමිණි පෙර හැඳින්වීමක් නොතිබූ පුද්ගලයන්, විවිධ සිරිත් විරිත්, ගති පැවතුම් හා වෙනස් වෙනස් සම්ප්‍රදාය ද වෙන් වෙන්ව බෙදා වෙන්කර දුන් ඉඩමක, ඉම නියරත්, තමාගේ ඉඩමට යොමු වූ ඇතුලුමුව ආදී පොදු බවට වඩා පුද්ගලිකත්වය තහවුරු කරන සැලැස්මත්, ආදී විවිධ හේතු නිසා සහයෝගය, එකඟ බව, සාමූහිකත්වය ගොඩ නැගීමට බාධාකාරී තත්ත්වයක් දක්නට ලැබේ. කෙසේ වුවද කුඩා වාරිමාර්ග වලටත් වඩා ගොවි සාමූහික සහභාගිත්වය ලබාගැනීමේ අවශ්‍යතා පවතිනුයේ ද මේ ආකාර මහා වාරිමාර්ග ආශ්‍රිත ජනපද වලය.

අධිරාජ්‍යවාදී යටත් විජිත යුගයේ සිට අපේ ජන සමාජය ලැබූ අත්දැකීම් මත ඔවුන්ගේ සිතුම් පැතුම් තීරණය වී ඇත්තේ සියලු පොදු සේවාවන් රජයේ බවත්, වැසියන් ඒවා පිළිබඳව රජය පැනවූ නීතිරීති මත බදු ගෙවමින් යම් යම් සීමාවන්ට යටත්ව පරිභෝජනය කළ යුතු බවත් ය. මේ සිතුම් පැතුම් රටාවත්, ක්‍රියාත්මක වූ නිලධාරී යන්ත්‍රයත්. ගොවීන්ගේ පොදු සහයෝගය රාජ්‍යය සැලසුම් වලට ලබා ගැනීමට ඇති ප්‍රධානතම බාධකයයි. මේ නිසා මෙම නිලධාරිවාදී ක්‍රියා පිළිවෙලත් සම්ප්‍රදායික පරිසරය තුල තීරණය වූ චින්තනයත් වෙනස් නොවනතාක් කල් සතුටුදායක ගොවි සහභාගිත්වයක් ජල පාලනය සඳහා හෝ වෙනත් කිසිදු සංවර්ධන කාර්යයන් සඳහා ලබාගත නොහැකිය. එබැවින් කිසියම් පරිවර්තනයක් ඇති කිරීම සඳහා ගොවි සහභාගිත්වය ලබා ගැනීමේ දී යම් යම් ශිල්ප ක්‍රම භාවිතා කිරීමට සිදුවනු ඇත. අප සහභාගීත්වය අපේක්ෂා කරන ගොවීන්ගේ පරිසරය තීරණය වී ඇති පසුබිම පරීක්ෂා කිරීමෙන් සහභාගිත්වය ලබා ගැනීම සඳහා ශිල්ප ක්‍රම යෙදීමේ වැදගත්කම පැහැදිලි වනු ඇත.

මහා වාරිමාර්ග ක්‍රමයක ජනපදයක් පිළිබඳව දළ පරීක්ෂ වක් කිරීමේ දී වුවද පැහැදිලි වන කරුණු රාශියකි. ඒ අතර දේශපාලන ප්‍රශ්න, කුල ප්‍රශ්න, පංති ප්‍රශ්න හා පුද්ගලික ප්‍රශ්න උඩ ගොවීන් – ගොවීන් අතර ඇති නිරන්තර අසමගිතාව, නිලධාරී උදසීනතාව හා නිලධාරීන් පිළිබඳ ගොවි ආකල්ප උඩ තීරණය වී ඇති නිලධාරී - ගොවි අසමගිතාව. ගොවි ජනගහණය වැඩිවීම සමඟ වැව් රක්ෂිත, ඇල රක්ෂිත, පාර රක්ෂිත, ආදී රක්ෂිතයන් පවා වගා කරමින ජනපදය තුල නිරන්තරයෙන් වර්ධනය වන ආර්ථික හා සමාජ අර්බුදය, යම් යම් අසාධාරණකම්, වෙනස්කම් හා ඇතැම් අසාර්ථක සැලසුම් නිසා පීඩනයට ලක්ව හෙම්බත් වූ ගොවි පවුල්, ග්‍රාම සංවර්ධන, ජනපද සංවර්ධන, පූජා මණ්ඩල, විහාර වර්ධන වැනි කඩා වැටුණු හෝ දිවවී ගිව සමාජ සංවිධාන වලින් ජනපදිකයන් ලැබූ නිස්සාර අත්දැකීම්, සාපේක්ෂ වශයෙන් අඩු පාසැල් අධ්‍යාපනය, සාපේක්ෂ වශයෙන් අඩු සමාජ සම්බන්ධතා, සාපේක්ෂ වශයෙන් අඩු ආදායම් තත්ත්වය පසුබිම් කොට ඇති සහයෝගය හා පොදු සහභාගිත්වයේ අවරෝහණ නැඹුරුව ප්‍රධාන වශයෙන් කැපී පෙනෙන ලක්ෂණ කිපයකි. මේ නිසා ජල පාලනය සඳහා ගොවි කණ්ඩායම් මගින් සහභාගිත්වය ලබා ගැනීම යනු සරල හා පහසු කාර්යක් යයි කිව නොහැකිය.

මේ නිසාම ගොවීන්ගේ සහභාගිත්වය ලබා ගැනීම සඳහා පවතින ආර්ථික හා සමාජ රාමුව තුළ යම් යම් ශිල්ප ක්‍රම යොද ගැනීමට සිදුවී තිබේ.

**i. ප්‍රතිලාභ තහවුරු කිරීමේ ක්‍රමය.**

කිසිවෙකු කිසිවක් කරනුයේ ඔහුට ආර්ථික හෝ සමාජ වාසියක් ඇත්නම් පමණි. මේ නිසා ගොවීන් ද යම් කටයුත්තකට සම්බන්ධ වීමට නම් ඔවුනට යම් ප්‍රයෝජනයක් තිබිය යුතුය. මේ නිසා ස්වයං ජල පාලනයට ගොවීන් ගොවීන් හුරු කරවීමට නම් ඔවුන්ගේ සේවය වෙනුවෙන් ලබාගත හැකි ප්‍රතිලාභ සහතික විය යුතු අතර, නිශ්චිත වශයෙන් වර්ග කර දැක්විය හැකි සමාජ, ආර්ථික ප්‍රතිලාභ පැහැදිලි කිරීමට හැකිකමක් තිබිය යුතුවේ.

ii ගොවීන් මගින් කෙරෙන ස්වයං ජල පාලනයක් යනු ඇත්ත වශයෙන්ම කෙත් ඇලක ගොවීන්ගේ සාමූහික තීරණයක් මත බෙද හද ගැනීමයි. කාර්යක්ෂම ජල පාරිභෝජන යක් ඇති කළ හැක්කේ එවැනි පොදු තීරණ තුළ පමණි. සාමූහික තීරණ ක්‍රියාත්මක

කිරීටම නම් සාමූහික තීරණය ගනු ලබන සමාජ සංස්ථා තිබිය යුතුය. එම සංස්ථාවේ ඒ ඒ ගොවිහු පුද්ගලිකව කොටස් කරුවන් වන නිසා සමූහය විසින් පොදු තීරණ ගැනීමට ඔවුනතර සහයෝගයක් තිබිය යුතුවේ. එහෙත් මුලදී දක්වන ලද විවිධ විෂමතාවයන් නිසා ගොවීන් සහයෝගී තීරණ වලට එඹීමට වඩා පුද්ගලික තීරණ වලට ඒමට ඇති ඉඩකඩ අධිකය. ඇතුළුමුව යටකිරීම්, ඇලවේලි කැපීම, ඉමනියර අරගල ආදී දහසකුත් එකක් ඔවුනොවුන් අතර ඇති අරගල ජනපදයකදී දැකිය හැකිය. මෙවැනි සිදුවීම් නිසා ඔවුනොවුන් තුළ යම් යම් ගොවීන් පිළිබඳව ඇති හැඟීම් ද සාමූහිකත්වයට හා පොදු සහයෝගිත්වයට ප්‍රධාන බාධකයක් වේ. කිසි දිනක ජනපදය තුළ යහපත් සංනිවේදනයකින් මේවා නිදහස් කර නැති නිසා කණ්ඩායම් තුළ සාපොච්චාරනය හා සංවාද ඇති කිරීමෙන් මෙවැනි බර නිදහස් කිරීමක් මගින් පොදු එකහ තාවයක් ඇති කළ යුතුවේ

iii විශ්වාසය තහවුරු කිරීමේ ක්‍රමය.

ජල පාලනයක් කිරීමේදී ගොවි සහභාගිත්වය යනු මුළුමනින්ම හුදකලාවූ ක්‍රියාවලියක් නොවේ. ගොවියාට පාලනය කළ යුතුව ඇත්තේ ඔහුගේ ක්ෂේත්‍ර ඇලවෙත ගලා යන ජල ප්‍රමාණයයි. ඉන් පෙරාතුව බෙදුම් ඇල දක්වා දිවෙන ජලය මුලුමනින්ම පාලනය වනුයේ නිලධාරී ක්‍රමයක් මගිනි. මේ නිසා ජල පාලනයේ ගොවි සහභාගිත්වය යනු අනිවාර්යයෙන්ම නිලධාරී-ගොවි සම්බන්ධීකරණයක් ද වනු ඇත මේ නිසා ජල පාලනය සඳහා ගොවි සහභාගිත්වයේ වැදගත් ශිල්ප ක්‍රමයක් වශයෙන් ගොවි-නිලධාරී සම්බන්ධීකරණය ද වැදගත් වනු ඇත. නමුත් ගොවීන් කෙරෙහි නිලධාරීන් තුළ ද, නිලධාරීන් කෙරේ ගොවීන් තුළද ඇත්තේ එතරම් යහපත් ආකල්පයක් යයි කිව නොහැකිය මේ නිසා ගොවීන් කෙරෙහි නිලධාරී විශ්වාසය තහවුරු වීමටත්, නිලධාරීන් කෙරේ ගොවීන්ගේ විශ්වාසය ඇතිවීමටත් යම් යම් ක්‍රියා මාර්ග ගත යුතුව ඇත. අම්පාර දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන ව්‍යාපාරයේ ගොවි සංවිධාක වරු මේ කාර්යයේදී හොඳ සංනිවේදකයෙකු සේ දැක්විය හැකිය. මීට අමතරව කලට වේලාවට පැමිණීම, පොරොන්දු ඉටු කිරීම, නියමිත දිනවලට ජලය බෙද හැරීම. ගොවීන් සහෝදර ජනතාවසේ සැලකීම වැනි කටයුතු මගින් ඒ ඒ ක්ෂේත්‍ර නිලධාරී මහතුන්ට ගොවි විශ්වාසය දිනාගත හැකිවේ. මෙවැනි යහපත් හැසිරීම රටාවකට ගොවිහු අනිවාර්යයෙන් ප්‍රති චාර දක්වනු ඇත.

මීට අමතරව පුද්ගලයාගේ ආත්මීය ස්වභාවයට බලපෑම කිරීම, පරිසරය වෙනස් කිරීමේ ක්‍රමය හෝ සැලසුම් කල අත්දැකීම් ලබාදීමේ ක්‍රමය වැනි සුදුසු විවිධ ශිල්ප ක්‍රම මගින් ගොවි සහභාගිත්වය ලබා ගැනීමට පෙළඹවීම් ඇතිකළ හැකිය. මෙවැනි යම් යම් විශේෂිත ශිල්ප ක්‍රම පාවිච්චි කළ යුතුව පවතින්නේ ඇත්ත වශයෙන්ම සාමූහික තීරණ ගැනීමට, පොදු එකඟතාවයට, හිතකර පරිසරයක් ස්වභාවිකව නොමැති නිසා එවැනි පරිසරයක් හිතා මතා ඇති කිරීමෙන් සාමූහිකත්වය පැවතීමට සුදුසු පරිසරයක් ඇති කිරීම සඳහා ය. එමෙන්ම පවතින ආර්ථික සමාජ පසුබිම් තුළ ඉබේ ගොඩ නැගෙන සාමූහික සංවිධාන පිළිබඳව අපේක්ෂා කළ නොහැකි නිසා මේ සඳහා යටත් පිරිසෙයින් ජනපද දෙක තුනකට එක් සංනිවේදකයෙකු වත් සිටීම අවශ්‍ය වේ.

ජල පාලනය සඳහා මෙවැනි සාමූහික සංවිධාන බිහි කිරීමේ සංනිවේදකයන් සඳහා වැය වන වැටුප් පිරිවැය විකල්පීය වශයෙන් ජල නාස්තියක් වන ආර්ථික අවාසියට වඩා බෙහෙවින් අඩු නිසා ජල පාලනයේ ගොවි සහභාගිත්වය සඳහා සමාජ සංවිධාන ඇති කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්වී තිබේ.

## Referencer


1. Agrarian Reseach and Training Institute: 1982, Yearbook for Sri Lanka Water Management Research 1980: Initial analysis of pre-rehabilitation situation in Left Bank Gal Oya,

2. Levine Gilbert-Concepts and strategies for water management. Paper presented at the workshop on water Managment in Sri Lanka, January 20 – 22, 1982 at the A. R. T. I. Colombo.

3. Nikahetiya S. B. R.- Organizing farmers for agricultural development Ibed

4. Wijayaratne C. M. Uneven distiribution of water; Causes, consequences and inplications for system management - Ibed.

5. Uphoff Norman - An overview of concepts and strategies for farmer participation in water management - Ibed.

6. De Silva N. G. R. Farmer participation in water management in the minipe project. – Ibed

7. Wickramasinha M. L. - The Gal oya experiment with Farmer participation - Ibed